ලිංගික හිංසනයක් හෝ ලිංගික හිරිහැරයක් යනු නීතියෙන් දඬුවම් ලැබෙන වරදක් මෙන්ම, සමාජ ගැටළුවක් ලෙසින්ද අරුත් ගැන්විය හැක. එසේ නම්, එවැනි වරද සිදුවීම අධෛර්යමත් කළ යුතු වනවාක් මෙන්ම, එවැනි වරදක නිසි බරපතල භාවය ද සමාජයට සන්නිවේදනය විය යුතු වේ. එහි වගකීම මාධ්‍ය අත ද පවතී.
ලිංගික හිංසනයක් යටතට වැටෙනා ඇතැම් වරදක් සමාජය තුළ සාමාන්‍යකරණය වීම වැළැක්වීමට, එවැනි වරද සම්බන්ධයෙන් මාධ්‍ය විසින් වාර්තා කරනා ආකාරය ද වැදගත් වේ. නිදසුනක් ලෙසට, ලිංගික හිංසනයක් යටතට ගත හැකි ලිංගික අවයව ඡායාරූපයක් තරුණියකට යැවීමේ (cyberflashing) වරදට තරුණයන් දෙදෙනෙකු අත්අඩංගුවට පත්වීමේ පුවත විමසා බැලිය හැක. එය වාර්තා වී තිබුණේ මේ අයුරිනි.
ලංකාදීප (පෙබ. 27, 2023) - "තරුණියගේ ෆෝනයට 'ජරාවක් එවූ තරුණයෝ දෙදෙනා කූඩුවට"
1) ඔබ සිතන ලෙසට, මෙම සිරස්තලයෙන්, ලිංගික හිංසනයක් සිදුවී ඇති බවක් පාඨකයාට සන්නිවේදනය වන්නේ ද?
2) මෙවැනි වරදක් සමාජය තුළ සාමාන්‍යකරණය වීම (normalisation) වැළැක්වීමට, මෙහිදී ලිංගික හිංසනයක් සිදුවී ඇති බව සිරස්තලයෙන් වඩාත් පැහැදිලිව ප්‍රකාශ කළ යුතු යැයි ඔබ සිතන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

